**පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය- (07 කොටස) 2017**

පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (07 කොටස) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) සහ ලංකා විදුලිබල මණ්ඩලය සහ සුනිත්‍ය බලශක්ති අධිකාරිය අතර 2013 මැයි 08 දින එළඹි අංක 43576 එස්ආර්අයි දරන ව්‍යාපෘති ගිවිසුමේ 2.09 (අ) ii වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘති ගිවිසුමට අනුව, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය එනම් වර්තමානයේ විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ලංකා විදුලි බල මණ්ඩලය සහ සුනිත්‍ය බල ශක්ති අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ 01 කොටස සිට 06 කොටස දක්වා ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය වගකීම දරන අතර ව්‍යාපෘතියේ 07 කොටස යටතේ ක්‍රියාත්මක කිරීමේ කටයුතු සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වගකීම දරයි. සුනිත්‍ය බලශක්ති අධිකාරිය ව්‍යාපෘතිය 07 කොටස යටතේ සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ විගණන නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුලත් වේ. පිවිතුරු විදුලි බලය සැපයුම වැඩිකිරීම හා ශ්‍රී ලංකාවේ විදුලි බලය බෙදාහැරීම් කාර්යක්ෂමතාවය හා විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘති පරිපාලන අත්පොත ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 25,240 කට සමාන එජඩො මිලියන 200 ක් වන අතර, ඉන් රු.මිලියන 3,786 කට සමාන එජඩො මිලියන 3.00 ක් ව්‍යාපෘතියේ 07 කොටස සඳහා වෙන් කර තිබුණි. ව්‍යාපෘතියේ සියලු කොටස් සඳහා වූ මූල්‍ය සම්පාදනයන් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| ප්‍රභවය | එජඩො (මිලියන) | ශ්‍රී ලංකා රු. (මිලියන) |
|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව (2013 මැයි 08 දිනැති ණය අංක. 2892 එස්ආර්අයි (එස්එෆ්) 08) | 30.00 | 3,786.00 |
| සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් (2013 මැයි 08 දිනැති ණය අංක. 2893 එස්ආර්අයි(එස්එෆ්)) | 100.00 | 12,620.00 |
| පිවිතුරු බලශක්ති අරමුදල (2013 අගෝස්තු 08 දිනැති ප්‍රදාන අංක. 0303 එස්ආර්අයි(ඊඑෆ්)) | 1.50 | 189.30 |
| ශ්‍රී ලංකා රජය | 68.50 | 8,644.70 |
| එකතුව | **200.00** | **25,240.00** |

ව්‍යාපෘතිය එහි කටයුතු 2013 සැප්තැම්බර් 30 දින ආරම්භ කරන ලද අතර 2017 ජූනි 30 දින වන විට නිම කිරීමට නියමිත විය. නමුත්, ව්‍යාපෘතිය නිම කිරීමේ දිනය 2019 ජූනි 30 දක්වා පසුව දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්

තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ අරමුදල් සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය සහ ප්‍රදාන වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය සහ ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඊ) ණය සහ ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(උ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(එ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව, සහ

(ඒ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 විගණන මතය

---------------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව සහ,

(ඉ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 දරන චක්‍රලේඛය අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 31 දිනට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා 2019 මාර්තු 27 දින ඉදිරිපත් කර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය හා 2017 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍යායනය කිරීම සඳහා ණය සහ ප්‍රදාන ගිවිසුම් යටතේ එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ එල්2892/2893 | 1.50 | 189.30 | 160.00 | 0.56 | 84.49 | 0.86 | 130.09 |
| ආසබැ ප්‍රදාන 303 | 1.50 | 189.30 | 116.00 | 0.33 | 49.75 | 0.732 | 111.75 |
| ශ්‍රීලංර | 0.08 | 10.00 | 1.00 | 0.00 | 0.474 | 0.023 | 2.923 |
| එකතුව | **3.08** | **388.60** | **277.00** | **0.89** | **134.71** | **1.61** | **244.76** |

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, තෝරාගත් ජාතික විශ්වවිද්‍යාල 04 ක උඩ පියසි මත සූර්යතාප බලය ජනනය කිරීමේ පද්ධති ස්ථාපනය කිරීම සහ හෝටල්, ව්‍යාපාරික අස්ථිත්වයෙන් වැනි පුද්ගලික අංශයේ තිරසාර සහභාගීත්වයන් වෙනුවෙන් පහසුකම් සැපයීම උඩපියසි මත සූර්ය තාප බලය ජනනය කිරීමේ නියමු ව්‍යාපෘතියේ අරමුණු වේ. ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2014 දෙසැම්බර් 31 දින වන විට අවසන් කළ යුතු වැඩ 2018 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර තිබුණි. කෙසේ වුවද, සූර්යතාප බලය ජනනය කිරීමේ පද්ධති ස්ථාපනය කිරීමෙහි නිරත කොන්ත්‍රාත්කරුවන්ගේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට අදාළ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 4. මූල්‍ය පාලනය පිළිබඳ ගැටලු

මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය විසින් ව්‍යාපෘතියේ ගනුදෙනු විගණනයට භාජනය කර නොතිබුණි.